# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1873/22 - 2014 ජූලි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2014.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනත

2010 අංක 14 දරන සිවිල් ගුවන්සේවා පනතේ 117(2) වගන්තියේ උප වගන්ති (ඒ) සහ (ට) යටතේ සිවිල් ගුවන්සේවා අමාත්‍යවරයා වශයෙන් මා වෙත පැවරුණු බලතල ප්‍රකාරව පහත රෙගුලාසි පනවමි.

පියංකර ජයරත්න,
සිවිල් ගුවන්සේවා අමාත්‍ය.

2014 ජූලි මස 24 වැනි දින,
බත්තරමුල්ලේ දී ය.

රෙගුලාසි

1. මෙම රෙගුලාසි "2014 අංක 01 දරන සිවිල් ගුවන් සේවා නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ප්‍රදානය කිරීමේ රෙගුලාසි " වශයෙන් හැඳින්වෙන අතර එය 2014 ජූලි මස 24 දින සිට බලාත්මක විය යුතු ය.
*ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය*

2. අවස්ථාවෝචිත පරිදි එසේ කිරීම අවශ්‍යයයි සලකනු ලබන්නේ නම් සහ එමගින් සිවිල් ගුවන් සේවාවේ නිරුපද්‍රිතතාවට හානියක් නොවන්නේ යැයි හැඟීයන්නේ නම් එවැනි අවස්ථාවක දී, සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පනවනු ලබන නියමයන් සහ කොන්දේසි වලට යටත්ව යම් පුද්ගලයෙකුට, පුද්ගල මණ්ඩලයකට, ගුවන් යානාවකට, ගගන නාවික නිපැයුමකට, ගගන යාත්‍රාංගණයකට, ගුවන් සමාගමකට, පියසර පුහුණු පාසලකට, ගුවන් සේවා උපකරණ නිෂ්පාදනය හෝ අළුත් වැඩියා කටයුතු කරන ආයතනයකට හෝ ගුවන් සේවාවට සම්බන්ධ පහසුකම් සහ සේවා සැපයුම්කරුවකුට හෝ කිසියම් රෙගුලාසියකින්, රීතියකින්, ක්‍රියාවට නැංවීමේ ප්‍රමිතියකින් හෝ විධානයකින් හෝ මින් මතු "නිශ්චිත අවශ්‍යතා" යනුවෙන් හඳුන්වනු ලබන සිවිල් ගුවන් සේවා සම්බන්ධයෙන් ප්‍රසිද්ධ කරනු ලැබ ඇති අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකිය.
*නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම සඳහා වූ අධිකාරිමය බලය*

3. සිවිල් ගුවස් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉහත රෙගුලාසි (2) යටතේ නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් ඉල්ලා සිටිනු ලබන මෙයින් මතු "අයදුම්කරු" යනුවෙන් හඳුන්වනු ලබන පුද්ගලයෙකුට හෝ ආයතනයකට හෝ එවැනි නිදහස් කිරීමක් ප්‍රදානය කිරීමට පෙර පහත සඳහන් එක් එක් කරුණු සම්බන්ධව සෑහීමකට පත්විය යුතු ය.
*නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ප්‍රදානය කළ හැකි තත්වයන්*



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අ. අදාළ නිශ්චිත අවශ්‍යතාවයන් සැලකිය යුතු මට්ටමින් සම්පූර්ණ කරනු ලැබ ඇති බව සහ තවදුරටත් අනුකූලවීමේ අවශ්‍යතාවයක් නොපවතින බව හෝ

ආ. සලකා බලනු ලබන කාරණය සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියා මාර්ග හෝ ගනු ලබන ක්‍රියාමාර්ග අදාළ නිශ්චිත අවශ්‍යතාවයන් සමඟ සැසඳෙන බව හේ ඊටත් වඩා සත්‍ය වශයෙන් ම ඵලදායක වන බව හෝ

ඇ. සලකා බලනු ලබන කාරණය අනුබද්ධයෙන් නිශ්චිත අවශ්‍යතාවයන් සාධාරණ හෝ උචිත නොවන බව හෝ

ඈ. සිදුවී ඇති කාරණාවක් අනුබද්ධයෙන් නිශ්චිත අවශ්‍යතාවයන් සාධාරණ හෝ උචිත නොවන බව සහ

ඉ. අදාළ නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම හේතු කොටගෙන සිවිල් ගුවන් සේවා නිරුපද්‍රිතතාවට ඇති අවදානම සැලකිය යුතු ලෙස ඉහළ නොයන බව.

නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ප්‍රදානය කිරීමේ ආකාරය සහ පිළිවෙළ

4. 2 වන රෙගුලාසිය යටතේ යම් අයදුම්කරුවකු විසින් යොමුකරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත හෝ ස්වකීය ක්‍රියාමාර්ගයක් මත හෝ නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කිරීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට හැකි ය. එසේ නිදහස් කිරීමක් ප්‍රදානය කිරීම සඳහා සලකා බැලිය යුතු යැයි ඔහු විසින් අදහස් කරනු ලබන වෙනත් ලියකියවිලි එවැනි නිදහස් කිරීමක් ඉල්ලුම් කරනු ලබන අයදුම්කරුවකුගෙන් කැඳවිය හැකි ය.

නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ප්‍රදානය කිරීම සඳහා වූ අයදුම්පත්‍රය

5. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් සඳහා අයදුම්කරුවෙකු විසින් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පහත කරුණු ලිඛිතව සැපයිය යුතු ය.

අ. අයදුම්කරුගේ නම සහ ලිපිනය ;
ආ. අදාළ අනුමැතීන් සම්බන්ධ තොරතුරු ;
ඇ. අපේක්ෂිත නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම සඳහා පාදක වන්නා වූ රෙගුලාසි, රීති ක්‍රියාවට නැංවීමේ ප්‍රමිති හෝ විධානයන්හි යොමු අංකයන් ;
ඈ. අපේක්ෂිත නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමෙන් බලපෑමකට ලක් විය හැකි කවර හෝ පුද්ගලයකු, ගුවන් යානයක්, ගගන නාවික නිපැයුමක් හෝ ගුවන් යානා වර්ග, ගගන නාවික නිපැයුම්, හෝ ද්‍රව්‍ය හෝ ද්‍රව්‍ය වර්ග, සේවා හෝ සේවා වර්ග සම්බන්ධ තොරතුරු ;
ඉ. අපේක්ෂිත නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම, යම් මෙහෙයුම් සම්බන්ධයෙන් සැලකිය යුතු ලෙස බලපෑ හැකි නම් ඒ සම්බන්ධ තොරතුරු ;
ඊ. අපේක්ෂිත නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම ලබා දිය යුත්තේ කවර හේතූන් නිසා ද යන වග සහ එම නිදහස් කිරීම් ලබා නොදුනහොත් සිදු විය හැකි අගතිය පිළිබඳ විස්තර ;
උ. අපේක්ෂිත නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ලබාදුනහොත්, එය ක්‍රියාත්මක කිරීමේ දී පවත්වා ගැනීමට අපේක්ෂිත නිරුපද්‍රිතතා මට්ටම සහතික කිරීම සම්බන්ධයෙන් අයදුම්කරු යෝජනා කරන වැඩ පිළිවෙළ ;
ඌ. අයදුම්කරු අපේක්ෂිත නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ක්‍රියාත්මක කිරීමට ඉල්ලුම් කරනු ලබන දිනය සහ ;
එ. අයදුම්කරු විසින් අපේක්ෂිත නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් වලංගු විය යුතු සීමාව.

සැකසීම සඳහා අවශ්‍ය වන කාලය

6. සිවිල් ගුවන්සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා එකඟ වී ඇත්නම් මිස අයදුම්කරු විසින් නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත දිනට අවම වශයෙන් මාස තුනකට පෙර ඒ සඳහා වූ අයදුම්පත සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානය

7. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කිරීමේදී හෝ පවත්නා නිදහස් කිරීමක් අළුත් කිරීමට තීරණය කිරීමේදී, ගුවන් සේවාවේ නිරුපද්‍රිතා මට්ටම අදාළ තත්ත්වය යටතේ ද එකඟ විය හැකි අවම මට්ටමක හෝ ඊට ඉහළින් පවත්වා ගැනීමට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානය යොමු විය යුතු ය.

නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් අළුත් කිරීම

8. සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කිසියම් අයදුම්කරුවකුට ප්‍රදානය කරන ලද නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක වලංගු කාලසිමාව එම නිදහස් කිරීම ලබා දුන් කොන්දේසි වලට හෝ ඊට සමාන කොන්දේසි වලට අනුව හෝ, පහත සඳහන් අවශ්‍යතා සපුරා ලන්නේ නම් මිස හෝ දීර්ඝ නොකළ යුතු ය.

අ. රෙගුලාසි 5ට අනුකූලව නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් අයදුම්කර ඇති විට

ආ. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් අත්‍යවශ්‍ය වන්නාවූ අමතර කරුණු හෝ නිදහස් කිරීම් තවදුරටත් පවත්වාගෙන යාමට අත්‍යවශ්‍ය වන්නා වූ කරුණු අයදුම්පතට ඇතුළත් කර තිබීම.

9. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කරන විට සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ගගන නාවික නිරුපද්‍රිතතා අවශ්‍යතා පෙරදැරි ව එකී නිදහස් කිරීමට අදාළව බලපැවැත්විය යුතු නියමයන් කොන්දේසි පැනවිය හැකි අතර එවැනි නියමයන් සහ කොන්දේසි ඒ සඳහා ඔහු විසින් නිකුත් කරනු ලබන අදාළ නිදහස් කිරීමේ ලියවිල්ලට ඇතුළත් කළ යුතු ය. නියමයන් සහ කොන්දේසි

10. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ප්‍රදානය කිරීමක් අයදුම්කර ඇති අවස්ථාවක සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා පහත පරිදි ලිඛිත දැනුම් දීමක් අදාළ අයදුම්කරු වෙත කළ යුතු ය. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ප්‍රදානය කිරීම් දැනුම් දීම

අ. ඔහුගේ තීරණය සහ,

ආ. නිදහස් කිරීම් ප්‍රදානය කිරීමකට වූ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමට තීරණය කර ඇත්නම් හෝ අයදුම්කරු විසින් අයදුම්කර නොමැති කොන්දේසියක් පැනවීම සඳහා නම් එම තීරණය සඳහා පාදක වූ හේතූන්

11. 10 වන රෙගුලාසිය යටතේ ප්‍රදානය කර ඇති නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමට අදාළ නිශ්චිත අවශ්‍යතාවල යොමු අංකය සහ එම නිදහස් කිරීමෙහි ස්වභාවය ගැසට් පත්‍රයේ සහ ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කළ යුතු ය. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් ප්‍රකාශයට පත් කිරීම

12. මෙම රෙගුලාසි යටතේ ප්‍රදානය කරනු ලැබූ නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක වලංගු කාලය පහත සඳහන් පරිදි අවසන් විය යුතු ය. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම්හි වලංගුභාවය

අ. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම ප්‍රදානය කරනු ලැබූ ලියවිල්ලේ සඳහන් කරනු ලැබ ඇති නිදහස් කිරීමෙහි වලංගුභාවය අවසන් වන දිනය හෝ

ආ. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම ප්‍රදානය කරනු ලැබූ ලියවිල්ලේ පැහැදිලිව සඳහන් කරන ලද දිනයක් නොමැතිනම් ක්‍රියාත්මක කරන ලද දිනයේ සිට වසරකට පසු

13. යම් අයදුම්කරුවකුට ප්‍රදානය කරනු ලැබූ නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් එම අයදුම්කරුගේ නමට විය යුතු අතර සහ එය වෙනත් පාර්ශවයකට පැවරිය නො හැකි ය. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් පැවරිය නොහැකි බව

14. 12 වන රෙගුලාසියේ කුමක් සඳහන් වුව ද, නිරුපද්‍රිතතා අවශ්‍යතා පිළිගත හැකි අවම මට්ටමටවත් සපුරා නොමැති බවට කරුණු පෙනී යන්නේ නම් ඕනෑම අවස්ථාවක දී යම් අයදුම්කරුවකුට ප්‍රදානය කරනු ලැබූ නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීමක් සීමිත කාලයකට අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට හෝ සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට කටයුතු කළ හැකි ය. එවැනි අත්හිටුවීමක් හෝ අවලංගු කිරීමක් හෝ අදාළ නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම ප්‍රදානය කරනු ලැබූ තැනැත්තාට වහාම දැනුම් දිය යුතු ය. නිශ්චිත අවශ්‍යතාවයන්ගෙන් නිදහස් කිරීම් අත්හිටුවීම හෝ අවලංගු කිරීම

08-571

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.